# 4. සේවා නියුක්තිය සහ වැටුප්

*දේශීය සහ විදේශ රැකියා අවස්ථාවන්හි වර්ධනය ශ්‍රම සැපයුමෙහි වර්ධනය ඉක්මවා යාම හේතුකොට ගෙන විරැකියා අනුපාතිකය තවදුරටත් පහත වැටීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කළේය. ඇතැම් අංශයන්හි නාමික වැටුප් හා වේතන වැඩිවීම තුළින් මූර්ත වැටුප් සම තත්ත්වයේ පැවතුණි.*

*සේවා නියුක්තිය*

▲ ශ්‍රම බලකා සහභාගිත්වය සියයට 51 ක අනුපාතයක් පිළිබිඹු කරමින් 2000 වර්ෂයේ තුන්වැනි කාර්තුව අවසානයේදී ශ්‍රම බලකාය මිලියන 6.7 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

▲ මුළු සේවා නියුක්තිය 1999 වර්ෂයේදී වූ ශ්‍රම බලකායෙන් සියයට 91 සිට 2000 වර්ෂයේ ප්‍රථම කාර්තු තුනෙහිදී සියයට 92 දක්වා ඉහළ යන ලදී.

▲ 2000 වර්ෂයේදී පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි වූ වේගවත් ප්‍රසාරණය හේතුවෙන් පෞද්ගලික අංශය, රැකියා අවස්ථා උත්පාදනෙහි ලා දයක වූ ප්‍රධාන සාධකය ලෙස තවදුරටත් පැවතිණ. නිමැවුම් කර්මාන්ත, කෘෂිකාර්මික, වෙළඳ සහ හෝටල්, රක්ෂණ සහ නිශ්චල දේපළ සහ ඉදිකිරීම් රැකියා උත්පාදනයෙහි මූලික අංශ ලෙස සැලකිය හැක.

▲ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අනුව 2000 වසර තුළදී අනුමත කළ නව ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන් තුළින් නව රැකියා අවස්ථා 38,000 ක් උද විය. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන අංශය, සේවා අංශය සහ උද්‍යාන විද්‍යා අංශයන් තුළ නව රැකියා අවස්ථා 31,000 ක් පමණ උත්පාදනය කළ අතර එය උත්පාදනය කළ මුළු රැකියාවන්ගෙන් සියයට 80 ක් පමණ විය.

▲ අඛණ්ඩව පහත වැටීමේ ප්‍රවනතාවය පිළිබිඹු කරමින් මුළු සේවා නියුක්තියෙහි, රාජ්‍ය අංශයේ දයකත්වය 2000 වර්ෂයේදී තවදුරටත් අඩු විය. මෙම දයකත්ව ප්‍රතිශතය 1999 දී 14.4 ක් වූ අතර, 2000 ප්‍රථම කාර්තු තුන තුළදී 13.6 දක්වා අඩු විය.

▲ මුළු සේවා නියුක්තියෙන් රාජ්‍ය අංශයෙහි (රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය) දයකත්වය පහත වැටීම, රාජ්‍ය අංශයේ ආයතනයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදමයන් සහ පෞද්ගලික අංශය තුළ රැකියා අවස්ථා උද වීමේ වේගවත් වර්ධනය නිසා ඇති වූ ලක්ෂණයකි.

▲ රාජ්‍ය අංශයේ සේවා නියුක්ති සමීක්ෂණයට අනුව මෙම අංශයෙහි සේවා නියුක්තිය 2000 වසර තුළදී 36,000 කින් (සියයට 3.2) පමණ ඉහළ ගියේය.

▲ මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේ, 1999 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට රජයේ විවිධ ආයතනයන් තුළ පුහුණුවීම් ලද උපාධිධාරීන්ට ස්ථිර පත්වීම් දීමයි. සමෘද්ධි, ආරක්ෂක අංශ සහ ගුරු වෘත්තීන්හිද වර්ධනයක් දක්නට ලැබිණ.

▲ අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය සියයට 1 කින් පමණ වර්ධනය වෙමින් 2000 වසර තුළදී 300,000 ක් විය.

*විරැකියාව*

▲ විරැකියා අනුපාතය තවදුරටත් පහත වැටෙමින් පවතින ප්‍රවණතාවයක් පෙන්විය.

▲ ස්ත්‍රීන් අතර විරැකියාව පුරුෂ විරැකියාවට වඩා තවදුරටත් නොවෙනස්ව ඉහළ ප්‍රමාණයකින් පැවතිණි. කෙසේ වුවද ස්ත්‍රී විරැකියා අනුපාතය, පුරුෂ විරැකියා

අනුපාතයට සාපේක්ෂව ශීඝ්‍රයෙන් පහත වැටෙමින් පැවතිණ. ස්ත්‍රී විරැකියා අනුපාතය 1999 දී වූ සියයට 13 සිට 2000 වසරේ මුල් කාර්තු තුන තුළදී සියයට 11 දක්වා පහත වැටුණු අතර පුරුෂ විරැකියා අනුපාතය 1999 තුළදී සියයට 6.7 සිට 2000 මුල් කාර්තු තුන තුළදී සියයට 5.9 දක්වා පහත වැටුණි.

- ▲ මෑත වර්ෂවලදී නිමැවුම්, කෘෂිකාර්මික සහ වාණිජ සහ හෝටල් අංශයන්හි ස්ත්‍රීන් සඳහා රැකියා අවස්ථා වර්ධනය වීම ස්ත්‍රී විරැකියාවෙහි තියුණු පහත වැටීමට හේතු විය.

- ▲ වයස් කාණ්ඩ අනුව විරැකියාව සලකා බැලීමේදී අවුරුදු 15-19 වයස් කාණ්ඩයෙහි විරැකියාව 1999 දී වූ සියයට 28.4 සිට 2000 වසරේ මුල් කාර්තු තුන තුළදී සියයට 22.0 දක්වා පහත වැටුණි.

- ▲ 2000 වසරේ මුල් කාර්තු තුනෙහි, අ.පො.ස.උසස් පෙළ සහ ඉන් ඉහළ අධ්‍යාපනික සුදුසුකම් ලද පුද්ගලයන් අතර විරැකියා අනුපාතය සියයට 14.6 ක් විය.

- ▲ අඩු සුදුසුකම් ඇති පුද්ගලයන් අතර විරැකියා අනුපාතය පහත තලයක පැවතිණි. උගත් අය අතර විරැකියාව ඉහළ තලයක පැවතීම කෙරෙහි අර්ධ වශයෙන් හේතු වූයේ සාම්ප්‍රදයික විෂය ධාරාවන් චාරිත්‍රයක් වශයෙන් ගැඹුරින් අධ්‍යයනය කළද පෞද්ගලික අංශයේ ශ්‍රම වෙළඳපොළට අවශ වන්නාවූ ඉංග්‍රීසි දැනුම සමග පරිගණක විද්‍යාව, මූල්‍ය, පරිපාලනය සහ වෙළඳපොළ යන අංශයන්ගෙන් බිහිවන සුදුසුකම් සහිත පුද්ගලයන් සැපයීමට නොහැකිවීම ය.

- ▲ විශේෂයෙන් පෞද්ගලික අංශය තුළ වෙනස් වෙමින් පවතින්නාවූ මිනිස් බල ඉල්ලුම සරිලන පරිදි පාසැල් සහ ඉහළ අධ්‍යාපනික පද්ධතිය ප්‍රතිව්‍යුහගත කළයුතු වන අතර එය මෑතදී හඳුන්වා දෙන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් ඇති වේයයි බලාපොරොත්තු වන අතර එමගින් උගතුන් අතර අධිකව පවතින්නාවූ විරැකියාව පහත වැටේයයි බලාපොරොත්තු වේ.

*විදේශ සේවා නියුක්තිය*

- ▲ 2000 වසර තුළදී ලියාපදිංචි වූ ප්‍රභවයන් තුළින් සැපයූ විදේශීය රැකියා සංඛ්‍යාව 160,000 ක් පමණ විය.

- ▲ 2000 වසර තුළදී බලය ලත් නියෝජ්‍ය ආයතන සංඛ්‍යාව 55 කින් පහත වැටුණ ද, බලය ලත් නියෝජිතයන් මගින් රැකියා සැපයීම 1999 වර්ෂයේදී වූ 120,000 සිට 2000 වසරේදී 126,000 දක්වා වර්ධනය වෙමින් 1999 දී සියයට 68 ක් වූ නියෝජිතයන් මගින් රැකියා සැපයීමේ දයකත්වය 2000 වර්ෂයේදී සියයට 79 දක්වා ඉහළ ගියේය.

- ▲ මෙම වර්ධනයට බෙහෙවින් හේතු වූයේ ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය විසින් බලය ලත් නියෝජිත ආයතන කෙරෙහි බල පවත්වන්නට යෙදුනාවූ නීතිරීති සහ අධීක්ෂණය හේතුකොටගෙන විදේශ රැකියා සඳහා පිටත් වන්නන් බලය ලත් ඒජන්තවරුන් කෙරෙහි ඇති විශ්වාසය වැඩිවීමයි.

- ▲ ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය විසින් ලියාපදිංචි විදේශ රැකියා සොයා යන්නන් සහ ඔවුන්ගේ පවුල් කෙරෙහි පහසුකම් රැසක් අඛණ්ඩව සපයනු ලැබිනි. මේවාට මහජන බැංකුව තුළින් නිවාස සහ ස්වයං රැකියා සඳහා සැපයූ ණය, පුහුණු පහසුකම් සැපයීම සහ විදේශ ගතවන්නන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම ඇතුළත් වේ.

## වැටුප්

- ▲ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙහිම සේවකයෝ වසර 2000 තුළදී වැටුප් වර්ධන ලබාගත්හ. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප වර්ෂය තුළදී දෙවරක්ම සකසන්නට යෙදුණි.

- ▲ 2000 වසරේ අගෝස්තු 01 දින සිට බලපවත්වන පරිදි මසකට රු.12,000 ට අඩු වැටුපක් උපයන සේවකයන්ට රු.600 ක මාසික අතුරු දීමනාවක් ලැබුනි. සියළුම රජයේ නිලධාරීන්ට රුපියල් 1000 ක අවමයකට යටත්ව විශ්‍රාම වැටුපට අදාළ නොවන සියයට 10 අතුරු දීමනාවක් 2000 ඔක්තෝබර් 01 දින සිට බලපාන පරිදි පිරිනැමුණි. රුපියල් 600 දීමනාව ගෙවීම මෙම සියයට 10 වැටුප් වර්ධනය තුළට අන්තර්ග්‍රහණය කර ගැණුනි. මෙම සංශෝධනයන් තුළින් වැටුප් සියයට 7.4 සිට 8.3 දක්වා නාමිකව වර්ධනය වූ අතර සියයට 1 සිට 2.8 දක්වා ප්‍රමාණයකින් මූර්ත වශයෙන් වර්ධනය විය.

- ▲ කර්මාන්ත සහ වාණිජ (වැටුප් පාලන මණ්ඩලය යටතට ගැනෙන) යන විධිමත් අංශයේ සේවකයන් සිය නාමික වැටුපෙහි වර්ධනයන් ලබාගත් අතර සමහර සේවා අංශයන්හි වැටුප් තවදුරටත් නොවෙනස්ව පැවතීම තුළින් ඔවුන්ගේ මූර්ත වැටුප් පහත වැටුනි.

- ▲ අවිධිමත් අංශයෙහි, විශේෂයෙන් කෘෂිකාර්මික සහ ඉදිකිරීම් අංශයන්හි සේවකයින් 2000 වසර තුළදී වැටුප් වර්ධනයන් අත්විඳි අතර එමගින් ඔවුන්ගේ මූර්ත වැටුප ද වර්ධනය විය.

### විදේශ සේවා නියුක්තිය

| සේවා නියුක්තිය | 1997 | 1998 | 1999 | 2000 |
|---|---|---|---|---|
| මුළු ගණන (පුද්ගලයින් දහස්) | 150.3 | 159.8 | 178.1 | 158.5 |
| සංයුතිය(%) | | | | |
| පුරුෂ | 25.0 | 33.7 | 35.4 | 30.6 |
| ස්ත්‍රී | 75.0 | 66.3 | 64.6 | 69.4 |
| කාණ්ඩය(%) | | | | |
| පුහුණු ශ්‍රමය | 16.4 | 19.9 | 20.9 | 19.9 |
| නුපුහුණු ශ්‍රමය | 83.6 | 80.1 | 79.1 | 80.1 |
| පෞද්ගලික ප්‍රේෂණ එ.ජ.ඩො.දශලක්ෂ | 921 | 999 | 1,056 | 1,160 |

*4.1 සංඛ්‍යා සටහන*

### ශ්‍රම බලකායෙහි ප්‍රවණතාවයන් සහ විරැකියාව




*4.1 රූප සටහන*